රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/2009

මගේ අංකය:EST-4/PEMNT/03/0201
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2009.11.25

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ තාවකාලික,**
**අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත**
**බඳවාගත් ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් ස්ථිර කිරීම**

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ 2006.04.25 දිනැති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි වර්ගීකරණ අනුව, ප්‍රාථමික ශ්‍රේණීන් ලෙස සලකන ලද තනතුරුවලට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති, පහත සඳහන් අවශ්‍යතා සපුරාලන ලද සේවකයන් 2009.11.01 දින සිට සේවයේ ස්ථිර කිරීමට රජය තීරණය කර ඇත.

i. 2009.11.01 දිනට, අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබීම.
ii. 2009.10.31 දිනට, (වැඩකරන) දින 180 ක්, සතුටුදායක ලෙස සහ අඛණ්ඩව සේවය කර තිබීම.
iii. තනතුරට අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරා තිබීම.
iv. තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගන්නා ලද දිනට, වයස අවු. 45 ට වඩා අඩුවීම.

02. 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 යටතේ ව්‍යාපෘතිවල සේවය සඳහා බඳවාගෙන ඇති සේවකයින් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ නොවේ.

03. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සියළුම ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් ස්ථිර සේවයට පත්කිරීම සඳහා අදාළ පත්කිරීම් බලධරයා විසින් කටයුතු කළයුතුය.

04. තවද මින් ඉදිරියට රාජ්‍ය අංශයේ (පළාත් රාජ්‍ය සේවය, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනද ඇතුළුව) ස්ථිර තනතුරු සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය නොමැතිව තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනමින් සේවකයන් බඳවා නොගත යුතුය.

05. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රාථමික ශ්‍රේණිවලට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයන් ස්ථිර කිරීම පිළිබඳව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව විසින් විධිමත් අධ්‍යයනයකින් පසුව තීරණය කරනු ලැබේ.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිවය.

ඩී.දසනායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය